# 3 ඉශ්‍රායෙල් දිවැසිවරු

පළමු සිසුවා : මම ඔබේ අනාගතය ගැන කියන්න ලෑස්තියි. ඔබේ ඉරණම අනුව තමයි සියල්ල සිදුවන්නේ. කිසිවෙකුටත් බැහැ ඉරණම වෙනස් කරන්න. එන්න, ඔබේ අනාගතය ගැන මම කියන්නම්.

දෙවන සිසුවා : මම ජීවමාන දෙවියන් වහන්සේගේ පණිවිඩය රැගෙන ආ උන්වහන්සේ වෙනුවෙන් කථා කරන්නෙක්. දේව කැමැත්ත ප්‍රකාශ කිරීමයි මගේ පරමාර්ථය.

තෙවන සිසුවා : මේ දෙදෙනා අතර වෙනසක් තියෙනවා ද? බාහිර පෙනුමෙන් නම් එක සමාන යි.

හතරවන සිසුවා : ඇයි නැත්තේ? පළමු වැන්නා ශාස්ත්‍ර කියන්නෙක්. දෙවැන්නා දිවැසිවරයෙක්.

තෙවන සිසුවා : ඉතින් දෙදෙනා ම එක ම දේ නොවෙයි ද ප්‍රකාශ කරන්නේ? මට නම් වෙනසක් තේරෙන්නේ නැහැ.

හතරවන සිසුවා : එකම දේ වෙන්නේ කොහොමද? එක්කෙනෙක් අනාගතය ගැන අනාවැකි කියනවා. අනාගතය ගැන කියන ශාස්ත්‍රකාරයා සියල්ල සිදුවන්නේ ඉරණම අනුව බවත් එය කිසිවකුටත් වෙනස් කළ නොහැකි බවත් පවසනවා.
එහෙත් ශුද්ධ බයිබලය පෙන්වා දෙන පරිදි දිවැසිවරයා කියන්නේ දෙවියන් වහන්සේගෙන් ලද විශේෂ කැඳවීම හා වරය තුළින් උන්වහන්සේගේ පණිවුඩය ප්‍රකාශ කරන්නෙක්. ඔහු දෙවියන් වහන්සේගේ පණිවුඩයේ හෙවත් වචනයේ එළිය ඔස්සේ මිනිස් ජීවිත විනිවිද දකිමින් ඔවුනට මග පෙන්වනවා. මෙහිදී ඔහු ඔවුන්ගේ හැසිරීම් රටාව ගැන සෘජුව පැහැදිලි කොට අනාගතයේ දෙවි සමිඳුන්ගේ ආසිරි ලබා ගැනීමට මග පෙන්වනවා. අවවාද කරනවා.

ඉශ්‍රායෙල් දිවැසිවරුන් ලෙස හඳුන්වන්නේ, දෙවියන් වහන්සේ වෙනුවෙන් කථා කළ උන්වහන්සේගේ පණිවිඩය ජනතාවට ප්‍රකාශ කළ පිරිසකි. ඔවුහු කිසිවකුගේ නිලය බලය, තත්ත්වය, තනතුර හා තමන්ට ලැබෙන ප්‍රතිචාර ගැන නොතකා දේව පණිවිඩය ප්‍රකාශ කළහ. දිවැසිවරුන් "නබී" යන හෙබ්‍රෙව් වචනයෙන් හඳුන්වනු ලැබූ අතර එහි තේරුම වූයේ, "දේව කැමැත්ත නොහොත් පණිවුඩය අන් අයට ප්‍රකාශ කරන තැනැත්තා" යන්න

යි. ග්‍රීක භාෂාවෙන් "ප්‍රොෆේටේස්" යන නමින් හැඳින්වූ අතර එහි අර්ථය වූයේ, "කෙනෙකු වෙනුවෙන් කථා කරන්නා" යන්න යි. ඒ අනුව, යාවේ දෙවියන් වහන්සේ වෙනුවෙන් කථා කරන්නකු ලෙස දිවැසිවරයා හඳුනාගත හැකි ය.

දිවැස්වැකි කීමේ දී තුන් ආකාර පද මාලාවක් ඔවුන් විසින් භාවිත කෙරිණි:

1. "සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක" (යෙසායා 1:2, මීකා 4:6)
2. "මෙසේ වදාරන්නේ සමිඳාණන් වන මම ය" (ජෙරමියා 33:11, එසකියෙල් 5:15)
3. "සමිඳාණන් වහන්සේගේ පණිවිඩය ...... වෙත පැමිණියේ ය" (එසකියෙල් 12:1)

මෙයින් පැහැදිලි වන්නේ, දිවැසිවරුන් ප්‍රකාශ කළේ, ඔවුන්ගේ අදහස් නොව දෙවියන් වහන්සේට අවශ්‍ය පණිවිඩය බව ය.

ඉශ්‍රායෙල් දිවැසිවරුන් ප්‍රධාන කොටස් දෙකකි.

1. දේශක දිවැසිවරු
2. ලේඛක දිවැසිවරු

## දේශක දිවැසිවරු

දේශක දිවැසිවරුන් නමින් පුරාණ ගිවිසුමෙහි පොත් නොමැති අතර ඔවුන්ගේ වචන හා ක්‍රියා 1-2 සාමුවෙල් හා 1-2 රාජාවලි ග්‍රන්ථවල දක්නට ඇත. එවැනි දිවැසිවරු කිහිප දෙනෙක් නම්,

1. නාතාන්
2. එලියා
3. එලිෂා
4. හුල්දා
5. අහියා
6. මීකායා

දේශක දිවැසිවරුන්ගේ ලක්ෂණ තුනකි:

1. ධ්‍යානයට සමවැදීම (1 සාමුවෙල් 10:5-15)
2. කණ්ඩායම් වශයෙන් මෙහෙවරෙහි යෙදීම (1 සාමුවෙල් 19:18-24)
3. තම දූත මෙහෙවර සනාථ කිරීම සඳහා හාස්කම් කිරීම (1 රාජාවලිය 17:16-24)

## ලේඛක දිවැසිවරු

මොවුන් නමින් පුරාණ ගිවිසුමෙහි පොත් ඇත. ඔවුන් ප්‍රධාන වශයෙන් කොටස් 2කි.

ලේඛක දිවැසිවරු

ප්‍රධාන දිවැසිවරු
1. යෙසායා
2. ජෙරමියා
3. එසකියෙල්

සුළු දිවැසිවරු
1. හොසියා
2. ජෝවෙල්
3. ආමොස්
4. ඔබදියා
5. ජෝනා
6. මීකා
7. නාහුම්
8. හබක්කුක්
9. ශෙපනියා
10. හග්ගායි
11. සෙකරියා
12. මලාකි

ප්‍රධාන හා සුළු දිවැසිවරුන් ලෙස වර්ගීකරණයේ පදනම වන්නේ, එක් එක් දිවැසිවර ග්‍රන්ථයේ විශාලත්වය යි.



3.1 රූපය - යෙසායා දිවැසිවරයා

**යෙසායා දිවැසිවරයාගේ කැඳවීම (යෙසායා 6:1-13)**

යෙසායා දිවැසිවරයා දේව මාලිගාවේ දී දර්ශනයක් දුටුවේ ය. සුවිශුද්ධ වූ දෙවියන් වහන්සේට තුති පැසසුම් කළ සෙරාප්වරුන්ගේ (දේව කණ්ඩායමකගේ) හඬින් දේව මාලිගාවේ අත්තිවාරම දෙදරා ගියේ ය. මෙසේ දෙවියන් වහන්සේ අත්දුටු යෙසායා දිවැසිවරයා, "අහෝ! මා වැනි කාලකණ්ණියෙක්; මට කිසි බලාපොරොත්තුවක් නැත. මන්ද, අපවිත්‍ර තොල් ඇති මිනිසකු වන, අපවිත්‍ර තොල් ඇති සෙනඟක් අතරේ ජීවත් වන මම සියලු බලැති සමිඳාණන් වහන්සේ මාගේ දෑසින් ම දිටිමි"යි කී ය. එවිට සෙරාප්වරයකු විසින් ගිනි අඟුරකින් යෙසායා දිවැසිවරයාගේ තොල් පවිත්‍ර කෙරිණි. අනතුරු ව "මම කවරකු යවම් ද? අප වෙනුවෙන් යන්නේ කවරෙක් ද?" යන සමිඳාණන් වහන්සේගේ හඬට, යෙසායා දිවැසිවරයාගේ පිළිතුර වුයේ, "මෙන්න මම මෙහි ය. මා යැව්ව මැනව" යන්න ය. ඉක්බිති යෙසායා දිවැසිවරයා සිය දූත කාර්යය වූ දේව පණිවිඩය ප්‍රකාශ කළේ ය. යෙසායා දිවැසිවරයා අත්දුටු දෙවියන් වහන්සේ සැබවින් ම අපගේ දේවස්ථානයේ ද වැඩ සිටින සේක. විශේෂයෙන්, උන්වහන්සේගේ පුත් ජේසුස් වහන්සේ, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ වැඩ වාසය කරන සේක. එම නිසා දෙවියන් වහන්සේ වැඩ සිටින උන්වහන්සේගේ දේවස්ථානය තුළ භක්තිවන්ත ව හැසිරීම අපගේ යුතුකම වන්නේ ය.


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## ජෙරමියා දිවැසිවරයාගේ කැඳවීම (ජෙරමියා 1:1-19)



3.2 රූපය - ජෙරමියා දිවැසිවරයා

දෙවියන් වහන්සේ ජෙරමියා දිවැසිවරයාට මෙසේ වදාළ සේක: "මා නුඹ කුසෙහි පිළිසිඳ ගැනීම ඇති කරන්නට පෙර පටන් මම නුඹ හඳුනා ගතිමි. නුඹේ උපතට පෙර නුඹ කැප කළෙමි, ජාතීන් හට දිවැසිවරයකු ලෙස මම නුඹ පත් කළෙමි." එවිට ජෙරමියා දිවැසිවරයාගේ පිළිතුර වූයේ, "මහෝත්තම ස්වාමීන් වන දෙවියන් වහන්ස, මා ළාබාලයකු වන බැවින් මම කතා කරන්නට නොදනිමි" යනුවෙනි. දේව කැඳවීමට විවෘත නොවූ ජෙරමියා දිවැසිවරයා ව දෙවියන් වහන්සේ දිරිමත් කරනුයේ, "නුඹ බාලයෙක් යයි නොකියන්න. මා නුඹ යවන සියල්ලන් වෙත යන්න. මා නුඹට අණ කරන සියල්ල පවසන්න. .... මෙන්න මාගේ පණිවිඩය, නුඹේ මුඛයෙහි තැබීමි. උදුරන්නට හා කඩා දමන්නටත්, නැති කරන්නට හා හෙළා දමන්නටත්, ගොඩනගන්නට හා සිටුවන්නටත් ජාතීන් හා රාජ්‍යයන් කෙරෙහි නුඹට බලය දී අද මම නුඹ පත් කළෙමි" කියා ය. ජෙරමියා දිවැසිවරයා මෙන් අපත් අපේ දුබලකම් තුළ දෙවියන් වහන්සේ අපට බාර දෙන වගකීම් හා යුතුකම් ඉටු කිරීමට ස්වාමීන් වහන්සේගෙන් බලවත් විය යුතු වෙමු.

## එසකියෙල් දිවැසිවරයාගේ කැඳවීම (එසකියෙල් 2:1-3:5)



3.3 රූපය - එසකියෙල් දිවැසිවරයා


දෙවියන් වහන්සේ එසකියෙල් දිවැසිවරයාට සිය පණිවිඩය දෙන්නේ සංකේතාත්මක ව ය. "මනුෂ්‍ය පුත්‍රය, මේ පොත අනුභව කර ගොස් ඉශ්‍රායෙල් වංශයට කතා කරන්නැ"යි වදාළ සේක. එසකියෙල් පොත අනුභව කළ විට එය ඔහුගේ කටට මී පැණි මෙන් මිහිරි විය. දෙවියන් වහන්සේ ඔහුට කැඳවීම බාර දෙනුයේ, "මට විරුද්ධ ව කැරලි ගැසූ, කැරලිකාර ජාතියක් වන ඉශ්‍රායෙල්වරුන් වෙත මම නුඹ යවමි"යි කියමිනි.

ගැඹුරු ඇදහිල්ලක් හා උදාර චින්තන ශක්තියකින් හෙබි එසකියෙල් බැබිලෝනීය විප්‍රවාසගත ජනතාව තුළ නව බලාපොරොත්තු ඇති කරමින් ඉශ්‍රායෙල් ජාතියේ නැවත හැරී ඒම පිළිබඳ ව විශ්වාසයෙන් කතා කළේ ය.

කිතුනු අප සියලු දෙනා ද දිවැසිවරුන් වීමට අපගේ ප්‍රසාද ස්නාපනයේ දී කැඳවීමක් ලබා ඇත. එසේ නම් අපත් අපගේ ප්‍රසාද ස්නාපන කැඳවීම වටහා ගනිමින් දේව වචනයේ පණිවිඩකරුවන් ලෙස කටයුතු කළ යුතු වෙමු. දේව වචනයට පිටුපා කටයුතු කරන අයට දේව වචනය අනුව ජීවත් විය යුතු ආකාරය පහදා දිය යුතු වෙමු.

## ක්‍රියාකාරකම

1. දී ඇති අකුරු උපයෝගී කර ගනිමින් දේශක හා ලේඛක දිවැසිවරුන් හඳුනාගෙන හිස්තැන් පුරවන්න.




2. දේව වචනය ප්‍රකාශ කිරීමට ඔබට ලැබුණු අවස්ථා **පහක්** ලියන්න.



### ජීවිතයට බිඳක්

- ප්‍රසාද ස්නාපනයෙන් ලද දිවැසි කැඳවීමට අනුව ජීවත්වීමට උත්සාහ කරමු.
- දේව වචනයේ පණිවිඩකරුවෝ වෙමු.
- සෑම විට ම සත්‍යයට සාක්ෂි දරමු.
- අපේ දුබලකම් තුළ දෙවියන් වහන්සේ ව අත්දකිමු.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.